සැ. යු. — 2015.06.19 දින පළ වූ අංක 1,920 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,921 - 2015 ජුනි මස 26 වැනි සිකුරාදා - 2015.06.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | -- |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | -- |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | -- |
| පළාත් සභා නිවේදන ... ... ... ... | -- |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 916 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 917 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | -- |
| විවිධ දැන්වීම් ... ... ... ... | -- |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 17 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජූලි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2015

බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින ආයතනවල බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 1.1 *මාසික වැටුප් පරිමාණය.-* රු. 12,470-10x130-10x145-10x160-12x170-රු. 18,860.

1.2 *දීමනා.-* රජය විසින් අනුමත ජීවන වියදම් දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

02. *වයස් සීමාව.-* 2015.07.10 දිනට වයස අවුරුදු 18 නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

03. *අධ්‍යාපන සුදුසුකම්.-* දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු ය. (එක් වරක දී අවම වශයෙන් විෂයන් 05ක් සමත්ව තිබිය යුතු ය.)

04. *අනෙකුත් සුදුසුකම්.-*

4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

4.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතු ය. (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතු ය.)

4.3 පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබීම. සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.

4.4 වාහන රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.)

4.5 අවම උස අඩි 05ක් විය යුතු ය.

4.6 දිවා රාත්‍රී කාලවල සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.

4.7 මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.-*

5.1 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

5.2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය.-* මේ සමග ඇති ආකෘතියට අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් පිළියෙල කරගත් අයදුම්පත් 2015.07.10 දින හෝ එදිනට පෙර ''ලේකම්, කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ (බ. ප.), අංක 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාර දිය යුතු ය. ඉල්ලුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු ය. දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ගේ අයදුම්පත්‍ර තම ආයතන ප්‍රධානීගේ නිර්දේශය ද සහිතව ඉදිරිපත් කළ යුතු ය. ප්‍රමාද වී හෝ නියමිත සුදුසුකම් සපුරා නොමැතිව හෝ අසම්පූර්ණව ඉදිරිපත් කෙරෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. තව ද, මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුලත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

එන්. නිල්වල,
ලේකම්.

කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග,
කර්මාන්ත, පරිසර, සංස්කෘතික හා කලා කටයුතු
අමාත්‍යාංශය (බ. ප.),
අංක 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.

### ආදර්ශ අයදුම්පත

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2015

01. (i) මුලකුරු සමග නම :—————.
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :—————.

02. (i) ස්ථිර ලිපිනය :—————.
(ii) රාජකාරි ලිපිනය :—————.
(iii) දුරකථන අංකය ඃ පෞද්ගලික :————. රාජකාරි :————.

03. (i) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2015.07.10 දිනට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඃ

අවුරුදු :————. මාස :————. දින :————.

04. (i) උපන් දිනය :—————.
(ii) 2015.07.10 දිනට වයස ඃ

අවුරුදු :————. මාස :————. දින :————.

(සම්මුඛ පරීක්ෂණයේ දී උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.)

(iii) ජා. හැ. අංකය :—————.

05. *අධ්‍යාපන සුදුසුකම් ඃ*

(සහතික මගින් සනාථ කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

5.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. ........................................ | ........................ |
| 2. ........................................ | ........................ |
| 3. ........................................ | ........................ |
| 4. ........................................ | ........................ |
| 5. ........................................ | ........................ |
| 6. ........................................ | ........................ |
| 7. ........................................ | ........................ |
| 8. ........................................ | ........................ |

06. 2015.07.10 දිනට පළපුරුද්ද.-

අවුරුදු :———. මාස :———. දින :———.

(සහතික මගින් සනාථ කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

........................................................................ වන මා විසින් මෙම අයැදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙලිවුවහොත් එසේ සවද්‍ය බව හෙළි වූයේ තෝරා ගැනීමට පෙර නම් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තව ද, ප්‍රායෝගික පරීක්ෂණයේ දී සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකශ කරමි.

.................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ

..................................................................................................මයා/මිය/මෙය මෙම දෙපාර්තමේන්තුවේ ................................ වශයෙන් ..........................දින සිට සේවය කරන බවත්, පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක උපායාගෙන ඇති/නැති බවත්, පූර්වාසන්න වසර 02 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇති/නැති බවත් අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

.......................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.

06-777

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනයයි

### වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2015.06.05 දින පළවූ අංක 1,918 දරන *ගැසට් පත්‍රයේ* iv (අ) විභාග, විභාග ප්‍රතිඵල ආදිය කොටසේ 06-193 දරන නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

3.2

(ආ) "අභ්‍යාසලාභී තනතුර''

ඉහත තනතුරට බඳවා ගැනීම් කිරීමේදී ප්‍රමාණවත් අයැදුම්කරුවන් ඉදිරිපත් වී නොමැති අවස්ථාවල වෘත්තිය සුදුසුකම් i හි දක්වා ඇති පරිදි ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගීවූවන්ට/ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලකදී යම් ඉසව්වකින් ජාතික මට්ටමින් 1, 2, 3 ස්ථාන ලබා ඇති අයට ඉහත අධ්‍යාපන සුදුසුකම් යටතේ ii හි සඳහන් අ.පො.ස (උ. පෙළ) එක් විෂයයක් සමත්වීම මත හා 3.1 (අ) iii හි සඳහන් සුදුසුකම් සේවයට පත්ව වසර 3 ක් ඇතුලත සම්පූර්ණ කිරීමේ පදනම මත මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකි ය.

එසේ තෝරා ගන්නා ලද නිලධාරීන් අභ්‍යාසලාභී තනතුරට පත් කරනු ලබන අතර, අවුරුදු 03 ක කාලය ඇතුලත අදාල සුදුසුකම් සම්පූර්ණ කළ යුතු වේ. එම සුදුසුකම් සම්පූර්ණ කළ දින සිට ක්‍රීඩා නිලධාරී III පන්තියට පත් කරනු ලැබේ.

අදාල කාලය තුල නියමිත සුදුසුකම් සම්පූර්ණ කිරීමට නොහැකි වුවහොත් එම අයගේ සේවය අවසන් කිරීමේ බලය පත්වීම් බලධාරියා සතු වේ. එසේම සාධාරණ හේතු සලකා බලා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය මත අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීම සඳහා වසරකට නොඅඩු කාලසීමාවකින් අභ්‍යාසලාභී තනතුරෙහි කාලසීමාව දීර්ඝ කිරීමේ බලය ද පත්වීම් බලධරයා සතු ය.

8. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2015.07.13 වේ.

කාන්ති වේහැල්ල,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

2015 ජුනි මස 10 වැනි දින.

06-767

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.